# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2239/54 - 2021 අගෝස්තු මස 06 වැනි සිකුරාදා - 2021.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

05 වන සංශෝධනය

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාව**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2013 ජුනි මස 26 වැනි දිනැති අංක 1816/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 අගෝස්තු මස 04 වැනි දින,

**I** කොටස

| | | |
|---|---|---|
| සංශෝධන අංක 01 | - | 2014 දෙසැම්බර් මස 12 වැනි දින හා අංක 1892/40 *අති විශෙෂ ගැසට් පත්‍රය.* |
| සංශෝධන අංක 02 | - | 2014 දෙසැම්බර් මස 19 වැනි දින හා අංක 1893/39 *අති විශෙෂ ගැසට් පත්‍රය.* |
| සංශෝධන අංක 03 | - | 2016 අගෝස්තු මස 23 වැනි දින හා අංක 1981/43 *අති විශෙෂ ගැසට් පත්‍රය.* |
| සංශෝධන අංක 04 | - | 2019 පෙබරවාරි මස 18 වැනි දින හා අංක 2111/4 *අති විශෙෂ ගැසට් පත්‍රය.* |


1A - G 34793 — 25 (2021/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II කොටස**

**පළමුවැනි පරිශිෂ්ඨය**

පළමුවැනි පරිශිෂ්ඨයේ අනු අංක 4 යටතේ සඳහන් සියලුම කරුණු වෙනුවට පහත සඳහන් කරුණු ඇතුලත් කරනු ලැබේ.

4. **කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ iii වැනි ශ්‍රේණියට බඳවා ගැනීම:**

**සුදුසුකම් :**

4.1 ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු:

4.1.1 බාහිර අයදුම්කරුවන් සඳහා -

(i) පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

(ii) ක්ෂේත්‍රයට අදාළව N.V.Q. 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

4.1.2 ආධුනිකයින් සඳහා:

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල/දෙමළ / ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව, විද්‍යාව ඇතුලුව විෂයයන් හතරකට (04) අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම;

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා හෝ තාක්ෂණ විෂයය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම ප්‍රමාණවත් වේ.)

*සටහන*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා හෝ තාක්ෂණ විෂයය ධාරාව යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව ඇති සහ අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

4.1.3 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් එක් සුදුසුකමක් ලබා තිබීම).

(i) දෙපාර්තමේන්තුවේ වසර 15 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්යය සහයක සේවාවේ ii හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධරයෙකු වීම.

(ii) දෙපාර්තමේන්තුවේ වසර 10 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්යය සහයක සේවාවේ ii හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධරයෙකු වීම හා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් පවත්වන්නා වූ ලිතෝකරණය පිළිබඳ පාඨමාලාවෙන් සමත්වී තිබීම.

(iiii) රජයේ මුද්‍රණාලයේ උත්තල මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු වශයෙන් වසර 06 ක සේවා පළපුරුද්දක් ලබා ඇති සහ දෙපාර්තමේන්තුගත තනතුරක සේවය ස්ථිර කර ඇති නිලධරයෙකු වීම.

(iv) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී , ගණිතය, සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා අතරින් මාධ්‍ය භාෂාව සඳහා සම්මාන සාමාර්ථ ඇතුළු අවම වශයෙන් සම්මාන හතරක් (04) ක් සහිතව විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම හා ඕනෑම විෂය ධාරාවකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවරකදී විෂයයන් තුන (03) කින් සමත්වී තිබීම.

(v) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම සහ ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් 04 වන මට්ටම (NVQ 04) සමත් වී තිබීම.

4.1.4 මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේදී බාහිර අයදුම්කරුවන් අතරින් 30% ක්ද , අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් 20% ක් ද , ආධුනිකයන් අතරින් 50% ක් ද වශයෙන් අනුපාතයක් සහිතව බඳවා ගනු ලැබේ. එසේ වුවද යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටින අවස්ථාවකදී එම සංඛ්‍යාව අනෙක් කණ්ඩායමකින් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකිවේ.

4.2 උත්තල මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු:

4.2.1 බාහිර අයදුම්කරුවන් සඳහා -

(i) පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

(ii) ක්ෂේත්‍රයට අදාළව N.V.Q. 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

4.2.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් එක් සුදුසුකමක් සම්පූර්ණකර තිබීම)

(i) දෙපාර්තමේන්තුවේ වසර පහළොවකට (15) නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්ය සහයක සේවාවේ ii හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධාරියෙකු වීම.

(ii) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ගණිතය, සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා අතරින් මාධ්‍ය භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද ඇතුළු අවම වශයෙන් සම්මාන හතරක් (04) ක් සහිතව විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම හා ඕනෑම විෂය ධාරාවකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවරකදී විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම.

(iii) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම සහ උත්තල මුද්‍රණයට අදාළව කර්මාන්ත ශිල්පී සහතිකය ලබා තිබීම.

4.2.3 ආධුනිකයින් සඳහා -

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව, විද්‍යාව ඇතුලුව විෂයයන් හතරකට (04) අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම;

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා හෝ තාක්ෂණ විෂයය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම ප්‍රමාණවත් වේ) ;

සටහන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා හෝ තාක්ෂණ විෂයය ධාරාව යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී, ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව ඇති සහ අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

4.2.4 මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ දී බාහිර අයදුම්කරුවන් අතුරින් 30% ක් ද, අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් 30% ක් ද, ආධුනිකයින් අතුරින් 40% ක් ද, වශයෙන් අනුපාතයක් සහිතව බඳවාගනු ලැබේ. එසේ වුව ද, යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටින අවස්ථාවක දී එම සංඛ්‍යාව වෙනත් කණ්ඩායමකින් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකි වේ.

4.3 පෙර මුද්‍රණ සැලසුම්කරු:

4.3.1 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඃ
(පහත සඳහන් එක් සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම)

(i) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ගණිතය, සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා අතරින් මාධ්‍ය භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද ඇතුළු අවම වශයෙන් සම්මාන හතරක් (04) ක් සහිතව විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම හා ඕනෑම විෂය ධාරාවකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවරකදී විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම.

(ii) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම සහ පෙර මුද්‍රණ සැලසුම්කරණයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 04 වන මට්ටම (NVQ 04) සමත් වී තිබීම හෝ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ඇස්තමේන්තුකරණ හා පිරිවැයකරණ පාඨමාලාව සමත් වී තිබීම.

4.3.2. ආධුනිකයින් සඳහා -

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව, විද්‍යාව ඇතුලුව විෂයයන් හතරකට (04) අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම;

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා හෝ තාක්ෂණ විෂයය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම ප්‍රමාණවත් වේ)ඃ

සටහන
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා හෝ තාක්ෂණ විෂයය ධාරාව යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී, ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව ඇති සහ අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

4.3.3 මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ දී අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් 50% ක් ද, ආධුනිකයින් අතරින් 50% ක් ද, වශයෙන් අනුපාතයක් සහිතව බඳවාගනු ලැබේ. එසේ වුව ද යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටින අවස්ථාවක දී එම සංඛ්‍යාව අනෙක් කණ්ඩායමෙන් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකි වේ.

4.4. මුද්‍රණ සංස්කාරක ඃ

4.4.1 සියලු අයදුම්කරුවන් සඳහා ඃ

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී -

(අ) සිංහල /දෙමළ හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක්,

(ආ) ගණිතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහ තවත් විෂයයන් 02 කට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්ව තිබීම.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී - සිංහල/දෙමළ හා ඉංග්‍රීසි යන විෂයයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව සියලුම විෂයයන්ගෙන් (සාමන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.)

සටහන

ඉහත යටතේ (ii) සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී, ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇති හෝ උසස් පෙළ විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සමත්වී නොමැති ඉල්ලුම්කරුවන් එම විෂයය සඳහා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඒ හෝ බී ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබීම සලකා බලනු ලැබේ.

4.4.2 මෙම තනතුර සඳහා මුලින් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා සුදුස්සන් තෝරාගනු ලැබේ. පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අභ්‍යන්තර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවක දී ආධුනිකයින් අතරින් හෝ බාහිර අයදුම්කරුවන් අතරින් අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

4.4.3 මෙම තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවාගනු ලබන අය මුලින්ම බඳවාගනු ලබන්නේ අභ්‍යාසලාභීන් වශයෙනි. අභ්‍යාසලාභීන් තෝරාගැනීම සඳහා පත්කිරීම් බලධරයා සුදුසුයයි තීරණය කරනු ලබන ආකාරයට තරග විභාගයක් හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙමගින් තෝරාගනු ලබන අභ්‍යාසලාභීන් සඳහා ව්‍යවස්ථාවේ 10.3.4 වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ වේ.

4.5 කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරු

4.5.1 බාහිර අයදුම්කරුවන් සඳහා

(i) පුහුණුවීම් කාලයත් සමග පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහකට (05) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(ii) ක්ෂේත්‍රයට අදාළව N.V.Q. 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

4.5.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් එක් සුදුසුකමක් සම්පූර්ණකර තිබීම)

(i) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ගණිතය, සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා අතරින් මාධ්‍ය භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද ඇතුළු අවම වශයෙන් සම්මාන හතරක් (04) ක් සහිතව විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම හා ඕනෑම විෂය ධාරාවකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවරකදී විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම.

(ii) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරතිබීම සහ කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරණ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 04 වන මට්ටම (N.V.Q. 04) සමත් වී තිබීම.

4.5.3 ආධුනිකයින් සඳහා -

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව, විද්‍යාව ඇතුලුව විෂයයන් හතර (04) කට අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හය (06) කින් සමත්වී තිබීම;

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී, සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම ප්‍රමාණවත් වේ)፡

4.5.4 මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ දී බාහිර අයදුම්කරුවන් අතුරින් 30% ක් ද, අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් 30% ක් ද, ආධුනිකයින් අතුරින් 40% ක් ද වශයෙන් අනුපාතයක් සහිතව බඳවාගනු ලැබේ. එසේ වුව ද යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටින අවස්ථාවක දී එම සංඛ්‍යාව වෙනත් කණ්ඩායමකින් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකිවේ.

4.6 මුද්‍රණ නිමැවුම්කරු :

4.6.1 බාහිර අයදුම්කරුවන් සඳහා -

(i) පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

(ii) ක්ෂේත්‍රයට අදාළව N.V.Q. 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

4.6.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් එක් සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම).

(i) දෙපාර්තමේන්තුවේ වසර පහළව (15) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්යය සහයක සේවාවේ ii හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධරයෙකු වීම.

(ii) දෙපාර්තමේන්තුවේ වසර 10 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්යය සහයක සේවාවේ ii ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධරයෙකු වීම හා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ පිළිගත් ආයතනයක පොත් බැඳුම්කරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

(iii) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී , ගණිතය, සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා අතරින් මාධ්‍ය භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද ඇතුළු අවම වශයෙන් සම්මාන හතරක් (04) ක් සහිතව විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම හා ඕනෑම විෂය ධාරාවකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවරක දී විෂයයන් තුන (03) කින් සමත්වී තිබීම හෝ

(iv) දෙපාර්තමේන්තුගත තනතුරක වසර 07 කට නොඅඩු ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ පොත් බැඳුම්කරණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් 04 වන මට්ටම (N.V.Q. 04) සමත් වී තිබීම.

4.6.3 ආධුනිකයින් සඳහා -

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ගණිතය, සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව, විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකට (04) අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් එකවර සමත්වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත්වී තිබීම ප්‍රමාණවත් වේ.)

4.6.4 මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ දී බාහිර අයදුම්කරුවන් අතුරින් 30% ක් ද, අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් 30% ක් ද, ආධුනිකයින් අතුරින් 40% ක් ද, වශයෙන් අනුපාතයක් සහිතව බඳවා ගනු ලැබේ. එසේ වුවද, යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටින අවස්ථාවක දී එම සංඛ්‍යාව වෙනත් කණ්ඩායමකින් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකි වේ.

4.6.5 මෙම තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් තෝරා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදුකරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ 10.3.8 වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ වේ.

4.7 මුද්‍රණ කාර්මික:

4.7.1 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව ඇතුලුව විෂයයන් හය (06) කින් සමත්වීම හා ඉන් අවම වශයෙන් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් ලබා තිබීම;

(ii) දෙපාර්තමේන්තුවේ වැද්දුම්කරුවකු / විදුලි කාර්මිකයකු වශයෙන් වසර පහ 05 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

4.7.2 ආධුනිකයින් සඳහා -

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව ඇතුලුව විෂයයන් හතර (04) කට අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර සංඛ්‍යාවක දී විෂයයන් හය (06) කින් සමත්වීම;

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී, සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත්වීම ප්‍රමාණවත් වේ.

4.7.3

(i) මෙම අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරෙන් 80% ක්ද, ආධුනිකයින් අතුරෙන් 20% ක් ද වශයෙන් අනුපාතයක් සහිතව බඳවා ගනු ලැබේ. එසේ වුව ද යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිතව අයදුම්කරුවන් නොසිටින අවස්ථාවක දී එම සංඛ්‍යාව වෙනත් කණ්ඩායමකින් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකිවේ.

(ii) මෙම තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් තෝරා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදුකරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ 10.3.8 වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ වේ.

5 - ඉහත 4.1.1 (i), 4.2.1 (i), 4.5.1 (i) , 4.6.1 (i) වගන්තිවල සඳහන් පස් අවුරුදු සේවා කාලය තුළ අයදුම්කරුවන් සේවය සඳහා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා තිබෙන බවට සනාථ කළ යුතු ය.

08 - 296

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.